**දේශීය ණය සහ සංවර්ධන අරමුදල - 2023**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි. අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීමේ අරමුණින් සංවර්ධනය කරන ලද මොබයිල් ඇප් මෘදුකාංගයේ වටිනාකම රු.2,437,425ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01ට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අස්පෘශ්‍ය වත්කම් ලෙස ඉදිරිපත් නොකර පරිගණක දෘඩාංග යටතේ දක්වා තිබුණි. | පෙන්වාදීම නිවැරදි වේ. අදාළ දෝෂ 2024 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර නොතිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගාලාජම රු.226,560,800ක් අඩුවෙන් ද, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාජම රු.130,126,748ක් වැඩියෙන් ද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම රු.96,425,733ක් අඩුවෙන් ද ගළපා තිබුණි. | -එම- | -එම - |
| (ඇ) | 2021 හා 2022 වර්ෂවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 අනුව හානිකරණ වටිනාකම ගණනය කිරීම සඳහා සලකා බැලූ ණය ශේෂ සහ 2021 සහ 2022 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ණය ශේෂ අතර පිළිවෙලින් රු.196,097,689 ක් හා රු.227,896,243 ක් ලෙස වෙනස්කම් පැවතීම හේතුවෙන්, 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් ගණනය කරන ලද හානිකරණ ගැළපීම වූ පිළිවෙලින් රු.230,284,678ක ලාභයක් හා රු.761,798,206ක අලාභයක් ඇතුළත් කර නැවත ගළපා සකස් කරන ලද ගිණුම්වල නිවැරදිතාවය විගණනයේදී තහවුරු නොවීය. | -එම- | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාරව ප්‍රධාන කළමනාකරණ පිරිසෙහි පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු යටතේ හෙළිදරව් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂක හා වර්තමාන අධ්‍යක්ෂවරයා වෙත ගෙවන ලද රු.1,179,488 ක් වූ ප්‍රතිලාභ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 අනුව ක්‍රියා කරනු ලැබේ. | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 අනුව හානිකරණ අලාභයක් සිදුවී ඇති බව නිශ්චය කිරීමට යොදාගත් නිර්ණායක මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළයුතු වුවද එසේ කර නොතිබුණි. | එකඟවේ. 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 07 ට අනුව හානිකරණ අලාභය නිශ්චය කළ ආකාරය පිළිබඳව හෙළිදරව් කිරීමට පියවර ගනිමි. | -එම- |
| (ඊ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 ට අනුව රු.76,582,323 ක් වූ ලැබිය යුතු පොලී වටිනාකම ක්‍රමක්ෂය පිරිවැයට එකතු කොට දක්වනවා වෙනුවට වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි. | එකග වේ. එම දෝෂය 2024 දී නිවැරදි කිරීමට ක්‍රියා කරමි. | -එම - |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත පොලී ගිණුම් 04ක රු. 59,718,232 ක් අඩුකර දැක්වීම හා අවිනිශ්චිත පොලී ගිණුම් 02ක රු. 1,607,963 ක් වැඩියෙන් දැක්වීම සහ ශුද්ධ ප්‍රතිඵලය සමුච්චිත අරමුදලට ගැළපීම කර තිබූ නමුත් එම ගැළපීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | එකඟ වේ. | සියළු ගැලපීම් සඳහා පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම වැඩියෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලිය රු.14,015,293 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | එකග වේ. ඉදිරි වර්ෂයේ සිට නිවැරදි ආදායම ගිණුම් ගත කරනු ලැබේ. | ගිණුම් තැබීම නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඇ) | විගණනයේ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු. 51,270,726 ක් වුවද එය රු.36,688,054 ක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දැක්වීම හේතුවෙන් ආදායම් බදු වියදම රු.14,582,672 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන ආදායම මත ගෙවන ලද අත්තිකාරම් ආදායම් බද්ද රු. 7,021,065 ක් වුවද ඉන් රු.2,190,461ක් ඉකුත් වර්ෂයට අදාළ ආදායම් බදු ගෙවීමේදී අඩුකර රු.4,830,604ක් වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් රු.4,830,604කින් ගෙවිය යුතු ආදයම් බදු මුදල හා වෙනත් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විගණනයේදී ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විලම්භිත බදු වගකීම රු.326,265 ක් වුවද එය රු.7,881,953 ක විලම්භිත බදු වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම හේතුවෙන්, විලම්භිත බදු වියදම ලෙස රු.7,530,191ක් ගිණුම් ගත විය යුතු වුවද රු.25,496ක විලම්භිත බදු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වේ. | -එම- |
| (ඊ) | වර්ෂය තුළ මිලදී ගත් රු.7,736,650ක පරිගණක දෘඩාංග සහ උපකරණවලට අදාළ ක්ෂය රු.1,407,877ක් වුවත් එය රු.5,412,576ක් ලෙස රු.4,004,699 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |
| (උ) | විගණනයේදී ගණනය කිරීම් අනුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ප්‍රදානවලින් ලබාගත් වත්කම් සඳහා ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම රු.2,397,639 වුවත් එය රු. 6,397,057 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් රු.3,999,418 කින් වෙනත් මෙහෙයුම් ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | -එම- |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපි වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන හා අවිනිශ්චිත පොලී එකතුව | 1,472,085,856 | 1,444,252,401 | 27,833,455 | එකඟ වේ. එම දෝෂය ගැළපීමට දැනට කටයුතු කෙරේ. | ලෙජර ගිණුම් සහ උපලේඛන ශේෂයන් සැසඳිය යුතුය. |
| (ආ) | ණයගැති ශේෂයන් | 443,986,105 (අරමුදල අනුව) | 251,435,722 (පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශන අනුව) | 192,550,383 | ණය මුදල් ප්‍රතිව්‍යුහගත කිරීමේදී එදිනට හිග පොළිය පසුව අය කිරීමේ පදනම මත ණය මුදලට අදාළ වාරිකය හා පොළිය අයකිරීමට තීරණය කර ඇත. මෙම පොළී මුදල අපගේ අවිනිශ්චිත ගිණුම්වල සටහන් කර ඇත. | පළාත් පාලන ආයතන සමග නිසි සම්බන්ධීකරණයක් සිදු කර ශේෂවල නොගැලපීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 අනුචිත ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ණය හානිකරණය ගැළපීමේදී ණය හා ලැබිය යුතු වටිනාකම, කාල විශ්ලේෂණ වාර්තාවෙහි ශේෂයන්ට වඩා රු.770,172,169ක් වැඩියෙන් යොදාගැනීමෙන් රු.167,561,679 ක් වූ හානිකරණ අගයෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවිය. | පිළිගනිමි. | ලෙජර ගිණුම්වල දැක්වෙන ශේෂයන්, උපලේඛන ශේෂයන් හා හානිකරණය සඳහා යොදාගත් ශේෂයන් එකිනෙකට පරස්පර නොවිය යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අය නොවන ණය ශේෂය රු. 670,289,991ක් වූ අතර එය වර්ෂ 01 සිට වර්ෂ 34ක කාලයක් දක්වා හිග හිට තිබුණි. | අදහස් දක්වා නොමැත | ණය අයකර ගැනීම කළ යුතුය. |
| (ආ) | වර්ෂය අවසානයේදී පළාත් පාලන ආයතනවල ණය ශේෂ තහවුරු කර ගන්නා බවට විගණකාධිපති වෙත වාර්තා කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂ 16 කට අදාලව රු. 58,788,239 ක් සඳහා ශේෂ තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් නොකෙරුණි. | ශේෂ තහවුරු කිරීම් සඳහා සභා 194කට ලිපි යවා ඇති අතර ඉන් සභා 178 ශේස තහවුරු කර ඇත. සභා 16ක ශේෂ සහතික කර නැත. | සියළුම ශේෂ තහවුරු කරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.57,579,949ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ නැවත ගළපන ලද අලාභය රු.528,948,635ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.586,528,584 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, සමාලෝචිත වර්ෂයේ හානිකරණ අලාභය පසුගිය වර්ෂයට වඩා රු.594,236,527ක් අඩුවීම හා මෙහෙයුම් ආදායම් රු.22,263,529 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 250ක නව ණය අනුමත කිරීමට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලින් සැලසුම් කර තිබුණ ද ණය ව්‍යාපෘති 07ක් සදහා රු. මිලියන 134.4ක් පමණක් අනුමත කර තිබුණි. ඒ අනුව ප්‍රගතිය සියයට 53.76 ක් විය. | අදහස් දක්වා නොමැත. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු අතර තාත්ත්වික ලෙස සැලසුම් සකස් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 750ක ණය නිකුත් කිරීමට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළින් සැලසුම් කර තිබුණ ද රු. මිලියන 388.96ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය සියයට 51.8ක් විය. | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඇ) | 2017 සිට 2023 දක්වා පැවතෙන රු.මිලියන 3.5ක අත්තිකාරම් ගිණුම්වල ශේෂ සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිරවුල් නොකල අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

### 3.2 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංශ 03ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරෙන පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට රු.2,938,000ක් සහ 2020 වර්ෂයේ සිට වර්ෂ 03ක් සදහා නඩත්තු ගාස්තු ලෙස රු.1,762,800ක් ගෙවා තිබුණද ණය කළමනාකරණ පද්ධතිය හැරෙන්නට මූල්‍ය කළමනාකරණ පද්ධතිය හා පොදු මොඩියුලය මෙම මෘදුකාංගය භාවිතා කර ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | දැනට පරිගණක පද්ධතියේ අඩුපාඩුවක් ඇති බැවින් පරිගණක පද්ධතියක් සකස් කර ගැනීම සඳහා ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර එම කමිටුව මගින් දැනට ප්‍රසම්පාදන ලියවිලි සකස් කරමින් පවතී. | පරිගණක පද්ධතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |